ශ්‍රම වාසනා අරමුදල
சிரம வாசனா நிதியம்
SHRAMA VASANA FUND

2022

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report



Shrama Vasana Fund,
No 97, Jawatta Road,
Colombo 05.
Tel : 011 258 8936 | Fax : 011 258 8937
Email : info@svf.gov.lk | Web : svf.gov.lk

වාර්ෂික වාර්තාව 2022

සම්පාදනය.

ශ්‍රම වාසනා අරමුදල

ප්‍රකාශනය.

ප්‍රකාශන කමිටුව ශ්‍රම වාසනා අරමුදල

සියලු හිමිකම් ඇවිරිණි. 2022

පටුන

පිටුව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 දැක්ම මෙහෙවර 03

1.2 මූලික අගයන් හා චර්යා ධර්ම 03

1.3 හැඳින්වීම 04

1.4 ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු 04

1.5 පාලන ව්‍යුහය හා කාර්යමණ්ඩල සංයුතිය 05

1.6 සංවිධාන සටහන 06

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 අරමුදලේ ස්ථාපිත කමිටු 07 - 08

2.2 අරමුදල සඳහා ලැබීම් 09

2.3 මූල්‍ය කාර්ය සමාලෝචනය 09 -11

2.4 ලබාගත් විශේෂ ජයග්‍රහණ 12 - 14

2.5 අරමුදලේ වැඩ පරිසරය 15

2.6 අරමුදල සතු සම්පත් 15

2.7 ශ.ද්‍ර.අ.ත. (SWOT) විශ්ලේෂණය 16 - 17

2.8 වසරේ කාර්ය සාධනය 17 - 22

03. පරිච්ඡේදය - මූල්‍ය තොරතුරු

3.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 24

3.2 මූල්‍ය කාර්යසාදන ප්‍රකාශය 25

3.3 අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශය 25

3.4 අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය 26

3.5 ගිණුම්වලට අදාල සටහන් 27 – 31

04. පරිච්ඡේදය -

4.1 ගිණුම්කරණ ප්‍රතිපත්තිය 32 - 36

4.2 විගණකාධිපති වාර්තාව 37 - 42

05. ඇමුණුම් 43 – 44

පළමු පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

දැක්ම

“තෘප්තිමත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්”

මෙහෙවර

“කම්කරු ප්‍රජාවට සුභසාධනය සැපයීම හා විපතකදී පිහිටවීම සඳහා පවතින යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු පුරවමින් වඩා පොහොසත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම”

මූලික අගයන් සහ චර්යාධර්ම.

ශ්‍රම වසනා අරමුදලින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සඳහා කාර්යක්ෂම වූ සේවාවක් සැපයීම සඳහා වන සදාචාරාත්මක බැඳීම තහවුරු කිරීම.

සේවා ලාභීන් සඳහා සේවා සැපයීමේ දී ශ්‍රම වාසනා අරමුදලේ නීති රෙගුලාසි හා ක්‍රම වේදයන්ට යටත්ව ඉහල ගුණාත්මක සේවාවක් ලබා දීම.

ශ්‍රම වාසනා අරමුදල මගින් සිදුකරනු ලබන සේවාවන් පිළිබඳව සේවා ලාභීන් තුළ වඩා දැනුවත් භාවයක් ඇති කිරීම.

හැඳින්වීම

ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6 ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දිනුම් අදිනු ලබන ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන අදායමයි. ජාතික සම්පත ලොතරැයි අලෙවි වර්ධනයත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය කර ගත හැක.

අරමුදලේ අරමුණු

1) සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

2) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

3) හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

4) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

5) ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.

6) සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරාවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම.

පාලන ව්‍යුහය.

1998 අංක 12 (2019 අංක 15 දරණ සංශෝධිත) දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින අතර අරමුදලෙහි සභාපතිත්වය අරමුදල අයත් රේකීය අමාත්‍යාංශයේ ලේකම් සතු වේ. ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමනාකරණය හා ඊට අදාල කටයුතු සියල්ලම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ සිදු කරනු ඇත.

2022 වසරේ ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය.

නම	තනතුර
ආර්.පී.ඒ.විමලවීර මහතා	සභාපති
බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා	සාමාජික
ඩී.පී.සී.ඊ. පීරිස් මහතා	සාමාජික
ජේ.එම්.එච්.එන්.ජී. ජයසේකර මහතා	සාමාජික
ඩී.සී. උදයංග පීරිස් මහතා	සාමාජික
ඩී. එස්. පුෂ්පකුමාර මහතා	සාමාජික
අජිත් සෙනවිරත්න මහතා	සාමාජික
ආර්.එම්.යූ.ටී.කේ. රත්නායක මහතා	සාමාජික

කාර්ය මණ්ඩල සංයුතිය

ජ්‍යෙෂ්ඨ මට්ටම		තෘතීය මට්ටම		ද්විතීය මට්ටම		ප්‍රාථමික මට්ටම		එකතුව		
අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	හිඟ සංඛ්‍යාව
01	01	04	03	08	08	04	03	17	15	02

සංවිධාන සටහන



ආර්.පී.ඒ.විමලවීර
සභාපති - ශ්‍රම වාසනා අරමුදල
ලේකම්,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය



ඩී.ආර්.ජයලත්
සාමාන්‍යාධිකාරී



එච්.ඩබ්.තිලකරත්න
කළමණාකරු



එම්.එල්.ජයමාලි
ගණකාධිකාරී



ඒ.ඩබ්.පී.සිල්වා
අභ්‍යන්තර විගණක



ඩබ්.ඒ.එන්.නිසංසලා
සහකාර කළමණාකරු



සී.ඩී.චන්ද්‍රසේන
කළමණාකරණ සේවා නිළධාරී



ජී.එච්.එන්.ටී.කරුණාරත්න
කළමණාකරණ සේවා නිළධාරී



එන්.එම්.එච්.ආර්.නවරත්න
කළමණාකරණ සේවා නිළධාරී



ජේ.එම්.පී.කේ.එච්.අයි.ජයසිංහ
කළමණාකරණ සේවා නිළධාරී



මධුශාන් රාජපක්ෂ
තාක්ෂණික
කළමණාකරණ සේවා නිළධාරී



ආර්.එම්.එන්.දිල්රුක්ෂි
කළමණාකරණ සේවා නිළධාරී



බී.ඒ.ඒ.මධුවන්ති
කළමණාකරණ සේවා නිළධාරී



ජී.එච්.එස්.නානායක්කාර
කළමණාකරණ සේවා නිළධාරී



ඒ.ආර්.ලොකුලියන
කාර්යාල සහයක



බී.එස්.සුමනදාස
රියදුරු



ටී.කේ.එන්.කේ.සේනාරත්න
රියදුරු

දෙවන පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ශ්‍රම වාසනා අරමුදලේ ස්ථාපනය කර ඇති කමිටු

1. අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව
2. ප්‍රතිලාභ කමිටුව
3. ප්‍රගති සමාලෝචන කමිටුව

- අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව

ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව ස්වාදීනව ක්‍රියාකරන අංශයක්වේ. මෙම කමිටුවේ මූලික අරමුණ වන්නේ ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු, සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්මේ නිර්ණායක / නිර්දේශ පදනම් කර ගනිමින් අරමුදලේ ආයතනික පාලනය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම ආදී කාර්යන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමයි.

ගිණුම් කටයුතු මෙහෙයවීමේ දී මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා හා අඩුපාඩු වලක්වා ගැනීම, වත්කම් ආරක්ෂා කිරීම වැනි කාර්යන්වලට බලපාන නීති රීතින්වල අනුකූලතාවය ආරක්ෂා කරගැනීම පිළිබඳ විමසිලිමත් වීමයි.

අභ්‍යන්තර විගණන කමිටුවේ ප්‍රධානියා/සභාපති, සෘජුවම අරමුදලේ සභාපති වෙත වාර්තා කරණ අතර මෙම විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

2022 වසරේ විගණන හා කළමනාකරණ කමිටුව පහත සාමාජිකයින් ගෙන් සමන්විත වේ.

1. ඩි.පි.සි.ඊ. පීරිස් මහතා	භාණ්ඩාගාර නියෝජිත/කමිටු සභාපති
2. ඩි.සිසිර පුෂ්පකුමාර මහතා	කමිටු සාමාජික
3. ආර්.එම්.යූ.ටී කේ. රත්නායක මහතා	කමිටු සාමාජික
4. ජී.ඩී.ඩී.එස්.එම්. සේනාධීර මහත්මිය	කමිටු සාමාජික
5. පසන් ලියනගේ මහතා	කමිටු සාමාජික/ විගණන අධිකාරී

අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුවේ මූලික කාර්යයන්

1. ශ්‍රම වාසනා අරමුදලේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම සහ ඇගයීම
2. අරමුදලේ පුර්ව නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැඟී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ශනය කිරීම.
3. වත්කම් අලාභ හානීන් සහ වංචා වලින් ආරක්ෂිතව තිබේ දැයි විශේෂිතව දැන ගැනීම

4. ගණුදෙනුවල අවශ්‍යතාවය හා ගණුදෙනුවලවල ප්‍රතිලාභ විමර්ශනය කිරීම, නාස්තිය සහ අසාමාන්‍ය ලෙස වැඩිපුර වියදම් කිරීම, වත්කම් ඉවත් කිරීම තුළින් සිදුවන ලාභ පාඩු සහ වියදම් අඩු කිරීම් වාර්තා පිළිබඳව විමර්ශනය කිරීම.

5. විගණන කමිටු රැස්වීමට පියවර ගැනීම හා විගණන තීරණ සැකසීම අදාළ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අංශ ප්‍රධානීන් අතර ඒවා බෙදාහැරීම.

6. විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.

7. අරමුදලේ සභාපති හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශන පැවැත්වීම.

8. අරමුදලේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කරනු ලබන විවිධ කමිටු වලට සහයවීම හා නිර්දේශ ලබාදීම.

- ප්‍රතිලාභ කමිටුව.

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණුවලට අනුව සිදුකරන ශිෂ්‍යත්ව ලබාදීම, වෛද්‍යාධාර ලබාදීම, නීති ආධාර ලබාදීම යන වැඩසටහන් වලට අදාල ව ප්‍රතිලාභීන් තෝරා ගැනීම ඒ සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්ණායක පදනම් කර ගනිමින් සිදු කරයි. මෙම ප්‍රතිලාභ කමිටුව අරමුදලේ සාමාන්‍යාධිකාරී, රේකීය අමාත්‍යාංශයේ නීති අංශයේ නිලධාරී වරයෙකු, වෘත්තීය රෝග විශේෂඥ වෛද්‍ය වරයකු යන අයගෙන් සමන්විත වේ. නිවැරදි ක්‍රමවේදයකට අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමට මෙම කමිටුව උපකාරී වේ.

- ප්‍රගති සමාලෝචන කමිටුව.

විගණනය විසින් වරින් වර දෙන ලද උපදෙස් අනුව ශ්‍රම වාසනා අරමුදලේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පිහිටුවන ලද කමිටුවකි. ශ්‍රම වාසනා අරමුදලේ දෛනිකව සිදුවන කටයුතු සොයාබැලීම ප්‍රධාන කාර්යය වේ. මෙම කමිටුව අරමුදලේ කළමනාකරු, ගණකාධිකාරී සහ සහකාර කළමනාකරු යන තිදෙනාගෙන් සමන්විත වන අතර, විශේෂයෙන් එදිනෙදා සිදුකරන කටයුතු, නිම කරන ලද ලිපිගොනු සකස්කිරීම, සැලසුම් කරන ලද වැඩ හා සත්‍ය ලෙස සිදු වී ඇති තත්වයන් පිලිබඳ සොයාබලා වැරදි හා අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම කමිටුව විසින් සිදු කරයි. අරමුදලේ ලිපිගොනු අඩුපාඩුවලින් තොරව පවත්වා ගෙන යාමට හා වැඩසටහන් ක්‍රමවත්ව සිදුකිරීමට මෙම කමිටුව පිටිවහලක් වී ඇත.

ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල්

(ඇ) අරමුදල මඟින් කරන ආයෝජන වලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුළුව මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අරමුදල වෙත ලැබෙන සියළුම මුදල්

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයන් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමඟින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුල ක්‍රියාත්මක කරනු ලැබේ, මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමඟ එම සීමා පුළුල් කරමින් වසරින් වසර සිදුකරන වැඩසටහන් ප්‍රමාණයන් ද වැඩිකරමින් කරමින් පවතී .

මූල්‍ය කාර්ය සාධන සමාලෝචනය.

අරමුදලේ වර්ධනය හා වටිනාකම (රුපියල් මිලියන).



ලොතරැයි ආදායම් (රුපියල් මිලියන)






වියදම් සංයුතිය
35,000,000.00
30,000,000.00
25,000,000.00
20,000,000.00
15,000,000.00
10,000,000.00
5,000,000.00
-
2018
2019
2020
2021
2022
පරිපාලන වියදම්
අරමුණුගත වියදම්


වත්කම් සංසන්දනය
500,000,000.00
450,000,000.00
400,000,000.00
350,000,000.00
300,000,000.00
250,000,000.00
200,000,000.00
150,000,000.00
100,000,000.00
50,000,000.00
-
2018
2019
2020
2021
2022
ජංගම වත්කම්
ජංගම නොවන වත්කම්

ලබාගත් විශේෂ ජයග්‍රහණ 2018-2022

- ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය දිනා ගැනීම - 2016
- පරිගණකගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.
- හොඳම වාර්ෂික වාර්තා හා ගිණුම් තරගයේ තෙවන ස්ථානය හිමිකර ගැනීම - 2019
- ජාතික ඵලදායිතා ඇගයීම් සහතිකය දිනා ගැනීම - 2020

අරමුදලේ අරමුණුවලට අනුව කටයුතු සිදුකරන අතර වඩාත් ඵලදායී ලෙස සේවා සැපයීම අරමුණු කර අමාත්‍යාංශය යටතේ පැවති ආයතන අතුරින් ආයතනයක් හිමිකරගත් පළමු ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය 2016 වසරේ ශ්‍රම වාසනා අරමුදල හිමි කරගන්නා ලදී.

ආයතනික කටයුතු පුළුල් කරමින් බොහෝ කාර්යයන් පහසුවෙන් හා කඩිනමින් සිදුකර ගැනීම සඳහා පරිගණක ගත ක්‍රමවේද අනුගමනය කරමින් මාර්ග ගත (Online System) ක්‍රමයට නිලධාරීන්ට තම රාජකාරී සිදු කිරීමටත්, ප්‍රතිලාභීන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් අවශ්‍ය පරිගණක ගත වැඩ පරිසරයක් (Computer Base Working Environment) ශ්‍රම වාසනා අරමුදල තුළ ස්ථාපනය කර ඇත. එසේම Digital Recording System භාවිතා කරමින් ඉතා කඩිනමින් ප්‍රතිලාභීන්ට තොරතුරු ලබාදීමද දැනටමත් සිදු කරයි. එසේම ජාතික ඵලදායිතා තරගාවලියට ඉදිරිපත් වී ප්‍රසංසනාත්මක සහතිකය ලබාගත් අතර, 5-S සංකල්පය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ තුළින් අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීම අරමුණ වේ.



පරිගණක ගත දත්ත පද්ධතිය


TÜV NORD

CERTIFICATE

Management system as per
ISO 9001 : 2015

SHRAMA VASANA FUND
Ministry of Foreign Relations,
Skills Development & Employment and Labour Relations,
Sri Lanka

Provision of Resources for the Welfare of Sri Lankan Labour Force and their related Parties

ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය ලබාගැනීම



හොඳම වාර්ෂික වාර්තා හා ගිණුම් තරගයෙන් තෙවන ස්ථානය ලබාගැනීම.



ජාතික ඵලදායිතා ඇගයීම් සහතිකය ලබාගැනීම

ශ්‍රම වාසනා අරමුදලෙහි වැඩ පරිසරය

කොළඹ 05, අංක 97 ජාවත්ත පාරේ 2 වැනි මහලේ ශ්‍රම වාසනා අරමුදල කාර්යාලය පිහිටා ඇත බිම් ප්‍රමාණය වර්ග අඩි.1500 ක් පමණ වන අතර, යහපත් කාර්යාල පරිසරයකින් යුක්තවේ. නමුත් එය ප්‍රධාන ගමනා කාර්යාලයට වාහනයකින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි ගමන මාර්ගයක පිහිටා නොමැති බැවින් සේවා ලබා ගැනීම සඳහා පැමිණෙන අයට තරමක් අපහසු වනු ඇත. දැනට පවතින කාර්යාලීය ඉඩ පහසුකම් වර්තමාන කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් නමුත් ගබඩා සඳහා අනෙකුත් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ඉඩක් නොමැත.

අරමුදල සතු සම්පත්

1. මානව සම්පත්

සාමාන්‍යාධිකාරී, කළමනාකරු, ගණකාධිකාරී, සහකාර කළමනාකරු, කළමනාකරණ සහකාරවරුන් අට දෙනෙක්, සහ එක් කාර්යාල සහකාරවරයෙක් සහ රියදුරන් දෙදෙනෙක්.

2. උපකරණ

ආසන දහසයක් සහිත වෑන් රථයක්, මෝටර් රථයක්, පරිගණක දහතුනක්, ඡායා පිටපත් යන්ත්‍ර දෙකක්, ෆැක්ස් යන්ත්‍රයක්, ලැප්ටොප් පරිගණක හතක්, රූපවාහිනී තුනක්, කළු සුදු මුද්‍රණ යන්ත්‍ර පහක්, වර්ණ මුද්‍රණ යන්ත්‍රයක්, ඒසී යන්ත්‍ර පහක්, කැමරාවක්, හඬ පටිගත කිරීමක් සහ ඇඟිලි සලකුණු යන්ත්‍රයක්.

3. ගෘහ භාණ්ඩ සහ උපාංග

මේස දහහතරක්, පුටු දහහතරක්, සෝෆා කට්ටලයක්, ටෙන්ඩර් පෙට්ටියක්, පුටු සහිත සම්මන්ත්‍රණ මේසයක්.

4. ශ්‍රම වාසනා අරමුදලෙහි කීර්තිනාමය

ශ්‍රම වාසනා අරමුදල විසින් මෙතෙක් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් කම්කරුවන්ගේ සහ සේවක සුභසාධනය ප්‍රවර්ධනය සඳහා නිසැකවම දායක වී ඇති බැවින් එහි ආරම්භයේ සිටම නිර්මාණය කර පවත්වාගෙන එන යම් කීර්තියක් හා ප්‍රතිරූපයක් තිබේ. කෙසේ වෙතත්, තව දුරටත් කළ දේ සහ කළ හැකි දේ අතර සැලකිය යුතු පරතරයක් තිබෙන අතරම වන ශ්‍රම වාසනා අරමුදල ප්‍රමාණවත් ලෙස ප්‍රවර්ධනය වී නොමැති බැවින් ශ්‍රම වාසනා යන නාමය රජයේ සේවා සපයන ආයතනයකට වඩා ලොතරැයියක් ලෙසින් තවමත් ජනතාව අතර ප්‍රචලිතව ඇත.

ශ.දු.අ.ත.(SWOT) විශ්ලේෂණය

බාහිර පරිසරය අධ්‍යයනය කිරීමේ අරමුණ වන්නේ ශ්‍රම වාසනා අරමුදලට බලපාන අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීමයි .අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීමේ අරමුණ එහි ඇති ශක්තීන් සහ දුර්වලතා හඳුනා ගැනීමයි SWOT විශ්ලේෂණය මඟින් ශ්‍රම වාසනා අරමුදලේ උපාය මාර්ගික දිශානතිය, ඉලක්ක සහ අරමුණු නිර්ණය කිරීමට පහසුකම් සපයනු ලබයි.

ශක්තීන්

- අරමුදලේ සැලකිය යුතු විශාලත්වය සහ වර්ධනයත් හොඳින් ස්ථාපිත ලොතරැයියකින් සවිමත් වීම.
- ලොතරැයි ආදායම හැර විවිධ ක්‍රියාකාරකම් හරහා සහ විවිධ මූලාශ්‍රවලින් අරමුදල පුළුල් කිරීමේ හැකියාව.
- ශක්තිමත් රාජ්‍ය ආයතන කිහිපයක පිටුබලය, - කම්කරු දෙපාර්තමේන්තුවේ සහයෝගය හා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ ජාතික ලොතරැයි මණ්ඩලය.
- පාර්ලිමේන්තු පනතක් මගින් අනුබල දෙන ශක්තිමත් නීති රාමුවක්.
- ත්‍රෛපාර්ශ්වික නියෝජනය කරන පළපුරුදු සහ දක්ෂ සාමාජිකයින්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් තිබීම.
- සුදුසුකම් ලත් සහ දක්ෂ කාර්ය මණ්ඩලයක් සිටීම.
- ISO 9001:2015 තත්ත්ව පාලන පද්ධතියක් තිබීම, හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් තරඟ සම්මානය ලබාගැනීම හා ජාතික ඵලදායිතා ඇගයීම් සම්මානය දිනා තිබීම.
- වෙබ් අඩවියක් සහ වෙබ් පාදක තොරතුරු පද්ධතියක් තිබීම.
- වෑන් එකක් සහ මෝටර් රථයක් තිබීම.

දුර්වලතා

- සමස්ත වෙළඳපොළට ලොතරැයිපත් සැපයීමට නොහැකි වීම, වෙළෙඳපොළ ඉතා විශාල වීම සහ සංවිධානය කුඩා වීම හා විමධ්‍යගත මෙහෙයුමක් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් හෝ අවශ්‍ය සම්පත් නොමැති වීම.
- පසුගිය කාලයේ ප්‍රතිලාභීන් කණ්ඩායමට විශාල බලපෑමක් කර නොතිබීම
- අරමුදලේ සේවාවන් හා අරමුණු සේවාදායක කණ්ඩායම හෝ සාමාන්‍ය ජනතාව අතර ප්‍රචලිත වීම අඩු මට්ටමක පැවතීම.
- වැඩසටහන් පුළුල් කිරීම සඳහා ශ්‍රම වාසනා ලොතරැයිය අලෙවිය වර්ධනය මන්දගාමීව සිදු වීම.
- ලැබෙන ආදායම මත බදු අය කිරීම.
- ශාඛා නොමැති අතර එබැවින් බාහිර මෙහෙයුම් සඳහා කම්කරු දෙපාර්තමේන්තුව මත යැපීමට සිදු වීම.

අවස්ථාවන්

- වෙළඳපල විශාල වන අතර සංස්ථාපන පනත මගින් අරමුදලට ලබා දී ඇති පුළුල් බලතල අනුව විෂය පථය පුළුල් කිරීමේ හැකියාව පවතී.
- තුන්වන ලෝකයේ ශ්‍රම බලකායට ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අරමුදල් සැපයීමට කැමැත්තෙන් සිටින රාජ්‍ය නොවන සංවිධාන සිටින අතර, අරමුදල සහ එහි ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඒවා භාවිතා කළ හැකිය

- ලොතරැයිපත් මිලදී ගත් අයට යම් ප්‍රමුඛතාවයක් ලබාදීමෙන් ප්‍රතිලාභීන් සහ ආදායම් මාර්ගය (ලොතරැයිය) අතර සම්බන්ධයක් ඇති කර ගැනීමේ හැකියාව ඇත.
- ලොතරැයි ටිකට් පත් අන්තර්ජාලය හරහා මිලදී ගැනීමට හැකිවන පරිදි පහසු ක්‍රම වේදයන් සැලසුම් කිරීම.

තර්ජන

- ලොතරැයි අතර තරඟයක් පවතින අතර වෙළඳපොලේ බොහෝ ලොතරැයි තිබීම.
- අරමුදල ලොතරැයිය සමඟ සම්බන්ධ වී ඇති නිසා ලොතරැයි ආදායමට වඩා අමතර මුදල් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අපහසු වීම.
- ලොතරැයිය කළමනාකරණය කිරීම අරමුදලේ නියෝජනයක් නොමැති ජාතික ලොතරැයි මණ්ඩලයේ අභිමතය මත සිදුකිරීම.
- නව ලොතරැයි හා ඉහල ත්‍යාග වෙළඳපොළට හඳුන්වාදීම හේතුවෙන් පවතින ලොතරැයිවල ආදායම පහත වැටීම.

ශ්‍රම වාසනා අරමුදලේ කාර්යසාධනය 2022

2020 වසර ආරම්භයත් සමග ලෝකයට බලපාන ලද කොවිඩ් 19 වසංගතයේ බලපෑම ශ්‍රී ලංකාවට ද බලපෑම් එල්ල කළේය මෙම වසංගත තත්වය හමුවේ 2022 වසර වෙනුවෙන් ශ්‍රම වාසනා අරමුදල සැලසුම් කරන ලද කාර්යසාධනය අපේක්ෂිත මට්ටමින් ඉටු කර ගැනීමට නොහැකි විය.

විශේෂයෙන් රටතුල ඇති වූ අරගල තත්වයන්, ඉන්ධන හිගය හා පැවති අස්ථාවර තත්වයන් මද්‍යයේ ශ්‍රම වසනා අරමුදලේ බොහෝ වැඩසටහන් ආයතනයෙන් බැහැර කර්මාන්තශාලා, වැඩබිම්, ඉලක්කකර එම පරිශ්‍රයන් වෙත ගොස් සිදුකරන පසුබිමක ආයතන වල සිදුකලයුතු වැඩසටහන් සැලසුම් කිරීමේදී ගැටළුකාරී තත්වයන් ඇති විය.

කෙසේ වෙතත් වසර මැද වනවිට රට තුල යම් සාධනීය මට්ටමක් ඇතිවීමත්, ක්‍රමයෙන් සුපුරුදු වැඩ පරිසරයන් ඇතිවීමත් සමග ශ්‍රම වසනා අරමුදල විසින් සැලසුම් කරන ලද වැඩසටහන් යම් මට්ටමකින් ඉටු කර ගැනීමට හැකිවිය.

එසේම ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ලොතරැයි ආදායම අඩුවීම හේතුවෙන් වාර්ෂිකව ලැබෙන ආදායම සීඝ්‍රයෙන් පහත වැටීම හා විශේෂයෙන්ම රටතුල උද්ගත වූ අර්බුදකාරී තත්ත්වය, ඉන්ධන හිගය හා ආර්ථික පරිහානිය වැනි හේතූන් නිසා 2022 අරමුදලේ කාර්යසාධනය ප්‍රසස්ථ මට්ටමට ලගාකර ගැනීමට නොහැකි විය. ඒ අනුව 2022 වසරට සැලසුම් කරන ලද වැඩසටහන් ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි සංශෝධනය කර සිදු කිරීමට තීරණය කරන ලදී.

01. දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ අතර සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. පසුගිය වසර කිහිපය දෙස බලන විට ලංකාවේ සිදුවන කාර්මික අනතුරු වලින් බොහෝ ප්‍රමාණයක් සේවක සේවිකාවන්ගේ නොසැලකිලිමත් බව, ආරක්ෂක උපකරණ භාවිතයට නැඹුරු නොවීම වැනි හේතු තුලින් සිදු වී ඇති බව පැහැදිලි විය.

මෙම හේතු නිසා අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසර වල අනතුරු වාර්තා වී ඇති හා අවදානම් තත්වයන් ඇති කර්මාන්තශාලා හඳුනාගෙන ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරුන් මාර්ගයෙන් සිදුකරන ලදී.

එසේම කම්කරු නීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරී තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයේ පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිද කරන ලදී.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර කම්කරු අණපනත් පිළිබඳ සේවක සේවිකාවන් හා සේවා ප්‍රජාව දැනුවත් වූ අතර වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් කාර්මික අනතුරු අවම කිරීමටත් හැකියාව ඇති විය.

2022 වසර වෙනුවෙන් රුපියල් 585,100/= මුදලක් වය කරමින් මෙවැනි වැඩසටහන් 28ක් මුළු දිවයිනම ආවරණය වන ලෙසින් පැවැත්වීමට හැකියාව ලැබුන අතර මේ තුලින් සෘජුවම සේවක සේවිකාවන් 1100 දෙනෙකු ප්‍රතිලාභ හිමිකරගන්නා ලදී,





ශ්‍රම වාසනා අරමුදල විසින් පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන්

02.සුබසාධන වැඩසටහන්

කම්කරු පවුල් නගාසිටුවීම අරමුණු කර අඩු ආධායම් ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දු දරුවන් වෙත අධ්‍යාපන ආධාර ලබා දීම මේ යටතේ සිදුකරන ලදී. මෙහිදී දු දරුවන් 1720 දෙනෙකු ප්‍රතිලාභ ලැබූ අතර ඔවුන් වෙනුවෙන් රුපියල් 8,707,733 පමණ පාසල් උපකරණ ලබා දෙන ලදී.







ශ්‍රම වාසනා අරමුදල විසින් පවත්වනු ලැබූ සුබසාධන වැඩසටහන්

03. මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා වල සිදුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මාර්ගයෙන් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන ප්‍රතිලාභීන් හඳුනාගන්නා අතර මියගිය හෝ පූර්ණ ආබාධිත තත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා එනම් වයස අවු. 3-25 දක්වා) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, මෙම දරුවන් සඳහා රු.50,000 ක ස්ථාවර තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දේ.

වර්තමානයේ රට තුල පවතින තත්වය හේතුවෙන් ශිෂ්‍යත්ව පිරිනැමීම වැඩසටහනක් ලෙස නොපැවැත් වූ අතර ප්‍රතිලාභීන් වෙත ඔවුන්ට අවශ්‍ය පාසල් උපකරණ කට්ටලය මිලදී ගැනීමට මුදල් ඔවුන්ගේ ගිණුම් අංක වලට බැර කරන ලදී. අනතුරුව එම උපකරණ මිලදී ගත් සත්‍ය බිල්පත අප වෙත ලබා ගැනීමෙන් පසු ඔවුන්ට හිමි ස්ථාවර තැන්පතු සහතිකය හා පාසල් පාවහන් වවුචරය ඔවුන් වෙත ලබා දෙන ලදී.

2022 වර්ෂය තුල ශිෂ්‍යත්වලාභීන් 68 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති අතර මේ වෙනුවෙන් රුපියල් 4,081,883.75 /= මුදලක් වැය වී ඇත.

04. නීති ආධාර ලබාදීමේ වැඩසටහන

පෞද්ගලික අංශයේ සේවකයන් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කර ඇති අවස්ථා වලදි, පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දමන අවස්ථාවකදි සහ කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ පැමිණිල්ලක් ගොනුකර ඇති අවස්ථාවකදි සේවකයන්ට සහන ලබාදීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

2022 වසර වෙනුවෙන් මේ යටතේ සිදුකරන ලද වැඩසටහන් පහත දක්වා ඇත.

<u>වැඩසටහන</u>	<u>ප්‍රතිලාභීන් ගණන</u>	<u>ලබාදුන් මුදල</u>
නීති ආධාර	38	රු. 938,761.85
නීති ආධාර අභියාචනා හා ප්‍රතිශෝධන	02	රු. 30,000.00
නීති ආධාර ශිෂ්‍යත්ව	15	රු. 147,150.00

05.වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන

සේවයේ යෙදී සිටියදී උද්ගත වූ ව්‍යත්තීය රෝගයකින් / කාර්මික රෝගයකින් පෙලෙන සේවා නියුක්තයන් සඳහා සහන සැලසීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

2022 වසර තුල ප්‍රතිලාභීන් 08 දෙනෙකු වෙත රුපියල් 280,000.00 මුදලක් වෛද්‍ය ආධාර ලෙස ප්‍රධානය කර ඇත.

06. සනීපාරක්ෂක ව්‍යාපෘතිය

බදුල්ල දිස්ත්‍රික්කය ඉලක්ක කර මෙම ව්‍යාපෘතිය සිදුකරන ලද අතර මෙහිදී අඩු ආධායම්ලාභී කම්කරු පවුල් තෝරා එම පවුල් වල සනිපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම මූලික අරමුණ විය. මේ සඳහා වැසිකිලි 147 ක් ඉදිකිරීමට ශ්‍රම වසනා අරමුදල රුපියල් 2,774,705/= මුදලක් වැයකර ඇත.

07.කාර්ය මණ්ඩල පුහුණුව

මූල්‍ය පරිපාලන ක්‍රමවේද පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන සඳහා ආයතනයේ නිලධාරීන් 03 දෙනෙකු සහභාගී කර වීම. වැය වූ මුදල රු.35,000.00

මූල්‍ය කොරතුරු

තුන්වන පරිච්ඡේදය

ශ්‍රම වාසනා අරමුදල
2022 12 31 දිනට
මූල්‍ය තත්ත්ව වාර්තාව

වත්කම්		රුපියල් 2022	රුපියල් 2021
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන අයිතම	සටහන් 03	921,405	677,883
තොගය	සටහන් 05	298,279	586,655
මුද්දර යන්ත්‍රයේ තැන්පතු		11,244	-
ස්ථාවර තැන්පතු ආයෝජන		50,000,000	70,000,000
කෙටිකාලීන ආයෝජන (Repo)		-	4,000,000
ලැබියයුතු අයිතම	සටහන් 04	389,518,435	351,639,626
		440,749,363	426,904,164
ජංගම නොවන වත්කම්			
ස්ථාවර තැන්පතු ආයෝජන		30,000,000	30,000,000
අස්පෘශ්‍ය වත්කම්	සටහන් 02	1,675,825	2,236,817
දේපල යන්ත්‍ර හා උපකරණ	සටහන් 01	9,767,519	11,053,104
		41,443,344	43,289,921
මුලු වත්කම්		482,192,707	470,194,085
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු අයිතම	සටහන් 07	290,077	73,855
වෙන්කිරීම්	සටහන් 08	1,206,000	1,247,000
ජංගම නොවන වගකීම්			
සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම		2,002,159	1,902,262
මුලු වගකීම්		3,498,236	3,223,117
ශුද්ධ වත්කම්		478,694,471	466,970,968
සමුච්චිත අතිරික්තය	සටහන් 06	475,784,972	463,707,968
සංචිත			
රාජ්‍ය ප්‍රධාන		2,909,500	3,263,000
මුලු ශුද්ධ වත්කම්		478,694,472	466,970,968

මෙහි පිටු අංක 24 සිට 33දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්වලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසක් වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAs) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කර ඉදිරිපත් කරන ලදී.

Chairman	Director	General Manager	Accountant
ආර්.පී.ඒ. විමලවීර.	බී.කේ.පී. චන්ද්‍රකීර්ති.	ඩී.ආර්.ජයලත්.	එම්.එල්. ජයමාලි.
සභාපති.	අධ්‍යක්ෂ	සාමාන්‍යාධිකාරී	ගණකාධිකාරී
ශ්‍රම වාසනා අරමුදල	ශ්‍රම වාසනා අරමුදල	ශ්‍රම වාසනා අරමුදල	ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදල

2022-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන වාර්තාව .

		රුපියල්	රුපියල්
ආදායම		2022	2021
ආදායම	සටහන් 10	51,821,295	34,672,316
මුලු ආදායම		51,821,295	34,672,316
වියදම්			
පරිපාලන වියදම්	සටහන් 11	17,368,592	14,791,283
ක්ෂයවීම	සටහන් 12	3,041,096	3,006,226
අරමුණු වෙනුවෙන් දරණ ලද වියදම්	සටහන් 13	18,231,231	14,445,075
වෙනත් වියදම්	සටහන් 14	252,396	288,897
		38,893,315	32,531,481
වසරේ අතිරික්තය		**12,927,980**	**2,140,835**

ශ්‍රම වාසනා අරමුදල

2022 12 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශය

		රුපියල්	රුපියල්
		සමුච්චිත අරමුදල	එකතුව
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		461,692,398.78	461,692,398.78
පෙර වර්ෂයේ ගැලපීම්		(125,265.68)	(125,265.68)
වසරේ අතිරික්තය		2,140,835.12	2,140,835.12
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		463,707,968.22	463,707,968.22
ස්ථාවර තැන්පතු පොලි	සටහන් 15.1	(848,264.48)	(848,264.48)
වත්කම් විකිණීමේ අලාභ	සටහන් 15.2	(2,713.02)	(2,713.02)
වසරේ අතිරික්තය		12,927,981.00	12,927,981.00
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		475,784,971.72	475,784,971.72

ශ්‍රම වාසනා අරමුදල

2022 12 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ලැබීම්	රුපියල් 2022	රුපියල් 2021
වසරේ අතිරික්තය	12,927,981.00	2,140,835.12
ගැලපීම්		
පාරිතෝෂික ගෙවීම්	332,885.00	-
මූල්‍ය නොවන වෙනස්වීම්		
ක්ෂයවීම	2,480,104.38	2,445,234.39
ක්‍රමක්ෂය	560,991.60	560,991.60
ක්‍රමක්ෂය - රාජ්‍ය ප්‍රධාන	(362,500.00)	(362,500.00)
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	99,897.00	569,695.00
වත්කම් විකිණීම් ලාභ	-	(4,965.57)
ආයෝජන ආදායම්	(13,546,769.03)	(6,311,136.97)
ආපදා ණය පොළී	(72,954.41)	(68,932.57)
කෙටිකාලීන ආයෝජන පොළී (Repo)	(17,446.57)	(295,650.37)
ක්ෂණික තැන්පතු පොළී (Call Deposit)	(251,205.47)	(22,006.85)
වෙනත් ආදායම්	(4,700.00)	(109,165.57)
කාරක ප්‍රාග්ධනය අඩු වැඩි වීම		
වෙනත් ගෙවියයුතු දෑ	216,221.86	(85,557.78)
වෙන්කිරීම්	(41,000.00)	7,500.00
වෙනත් ලැබියයුතු දෑ	(32,126,720.00)	(14,629,658.00)
තොගය	288,376.10	908,489.81
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ලැබීම්	(29,516,838.54)	(15,256,827.76)
පාරිතෝෂික ගෙවීම්	(332,885.00)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ ලැබීම්	(29,849,723.54)	(15,256,827.76)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ලැබීම්		
පිරියත හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	(1,189,182.00)	(1,195,605.00)
මුද්දර යන්ත්‍ර තැන්පතු	(11,244.00)	-
ආයෝජන ආදායම්	6,946,415.51	5,514,818.48
ආපදා ණය පොළී	72,954.41	68,932.57
කෙටිකාලීන ආයෝජන පොළී	17,446.57	295,650.37
වෙනත් ආදායම්	4,700.00	109,165.57
ක්ෂණික ආයෝජන (Call Deposit) තැන්පතු පොළී	251,205.47	22,006.85
දේපළ විකුණුම් වලින් ලැබීම්	950.00	15,050.00
ආයෝජන - ස්ථාවර තැන්පතු	20,000,000.00	13,000,000.00
ආයෝජන - කෙටිකාලීන (Repo)	4,000,000.00	(4,000,000.00)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ ලැබීම්	30,093,245.96	13,830,018.84
මුදල් හා මුදල් හා සමාන අයිතම අඩු වැඩි වීම	243,522.42	(1,426,808.92)
වසර මුල මුදල් හා මුදල් හා සමාන අයිතම	677,882.85	2,104,691.77
වර්ෂය අවසානයේ මුදල්, මුදල් හා සමාන අයිතම	921,405.27	677,882.85

ගිණුම්වලට අදාල සටහන්.

සටහන 01

දේපල පිරියත හා උපකරණ

රුපියල්

	ප්‍රත්‍යාගණනය කල වටිනාකම 01-01-2022	එකතුකිරීම්	මාරුකිරීම්	අපහරණය, /ලියා හැරීම/වෙන ස්කිරීම	ශේෂය 2022-12-31
වාහණ	12,882,500.00	-	-	-	12,882,500.00
යන්ත්‍රෝපකරණ	327,092.00	163,012.50	-	4,000.00	486,104.50
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	232,900.00	7,500.00	-	2,000.00	238,400.00
ශීතකරණ	180,000.00	846,170.00	-	-	1,026,170.00
පරිඝනක	3,680,782.30	172,500.00	-	-	3,853,282.30
ලීබඩු හා උපකරණ	876,503.60	-	7,500.00	1,000.00	883,003.60
කාර්යාලීය උපකරණ	323,116.00	-	1,500.00	-	324,616.00
	18,502,893.90	1,189,182.50	9,000.00	7,000.00	19,694,076.40

සටහන 02

ක්ෂය කිරීම්

	ප්‍රත්‍යාගණනය කල වටිනාකම 01-01-2022	වසරේ ක්ෂය	මාරුකිරීම්	අපහරණය, /ලියා හරිම/වෙන ස්කිරීම	ශේෂය 2022-12-31
වාහණ	5,424,540.14	1,288,250.00	-	-	6,712,790.14
යන්ත්‍රෝපකරණ	74,408.56	66,377.43	-	1,906.85	138,879.14
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	118,959.11	57,917.12	-	1,191.78	175,684.45
ශීතකරණ	78,904.11	37,854.62	-	-	116,758.73
පරිඝනක	1,546,508.54	920,668.18	-	-	2,467,176.72
ලීබඩු හා උපකරණ	162,023.90	84,565.19	207.53	238.35	246,558.27
කාර්යාලීය උපකරණ	44,445.83	24,233.18	31.13	-	68,710.14
	7,449,790.19	2,479,865.72	238.66	3,336.98	9,926,557.59

සටහන 03

මුදල් හා මුදල් හා සමාන අයිතම

ජංගම ගිණුම මහජන බැංකුව	911,405.27
E-Card මහජන බැංකුව	10,000.00
	921,405.27

සටහන 04

වෙනත් ලැබියයුතු දෑ

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	378,809,164.18
ආපදා ණය	1,588,600.00
ස්ථාවර තැන්පතු පොළී	9,117,671.23
ගෙවියයුතු තැන්පතු	3,000.00
	389,518,435.41

සටහන 05

තොගය

ලිපිද්‍රව්‍ය	269,981.61
වැඩසටහන් වලට අදාල ද්‍රව්‍ය	28,297.55
	298,279.16

තොගයන් සාමාන්‍ය බර තැබූ ක්‍රමයට ගණනය කර ඇත.

සටහන 06

2022-01-01 දිනට සමුච්චිත අරමුදල	462,856,990.72
2022 වසරේ අතිරික්තය	12,927,981.00
	475,784,971.72

සටහන 07

වෙනත් ගෙවියයුතු දෑ	7,798.45
දුරකථන බිල්	87,476.80
වෙනත්	180,000.00
වෛද්‍ය සහණ	12,801.71
ජල බිල්පත්	2,000.00
ශිෂ්‍යත්ව	290,076.96

සටහන 08

වෙන්කිරීම්

නීති ආධාර සඳහා	937,000.00
නීති ආධාර ඇපිල්	100,000.00
විගණන ගාස්තු	169,000.00
	1,206,000.00

සටහන 09

ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමයට පහත අනුපාතයන් ට ක්ෂය කර ඇත.

වාහණ	10%
යන්ත්‍රෝපකරණ	20%
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	25%
ශීතකරණ	20%
පරිඝනක	25%
ලීබඩු හා උපකරණ	10%
කාර්යාලීය උපකරණ	7.50%
මෘදුකාංග	20%

සටහන 10

ආධායම

ලොතරැයි ආධායම	37,565,720.00
ස්ථාවර තැන්පතු ආයෝජන ආධායම්	13,546,769.03
ආපදා ණය ආධායම	72,954.41
කෙටිකාලීන (Repo) ආයෝජන	17,446.57
ක්ෂණික ආයෝජන (Call Deposit)	251,205.47
රාජ්‍ය ප්‍රධාන	362,500.00
වෙනත්	4,700.00
	51,821,295.48

සටහන 11

පරිපාලන වියදම්

වැටුප් හා වේතන	6,503,393.84
සේ.අ.අ.	1,720,875.93
සේ.හා.අ	258,131.39
ජීවනාධාර දීමනා	1,412,635.71
වෙනත් දීමනා	1,500,470.71
සන්නිවේදන දීමනා	123,000.00
සභාපති දීමනා	190,524.19
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	280,000.00
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා	12,000.00
අභ්‍යන්තර විගණක දීමනා	44,500.00
වෘතිය දීමනා	255,000.00
ප්‍රසාධ දීමනා	615,000.00
සේවක පාරිතෝෂික	432,782.50
සේවක සුබසාදනය	188,000.00
අතිකාල හා නිවාඩු දින දීමනා	152,186.92
ගමන්වියදම්	106,320.00
ප්‍රවාහණ වියදම්	210,750.20
ලිපිද්‍රව්‍ය	388,432.68
තැපැල් වියදම්	30,886.00
දුරකථන බිල්	81,376.88
සංග්‍රහ වියදම්	62,801.50
කෙටි ආහාර	72,869.10
විවිධ වියදම්	17,420.00
වෙනත් වියදම්	37,763.00
විගණන ගාස්තු	156,000.00
ජලය හා විදුලිය	66,869.86
වෙනත් සේවා	567,081.06
සේවා හා නඩත්තු	1,563,471.03
වාහන රක්ෂණය	109,348.11
වාර්තා මුද්‍රණය	151,390.00
කාර්යමණ්ඩල පුහුණුව	57,311.26
	17,368,591.87

සටහන 12

ක්ෂය වීම

වාහණ	1,288,250.00
යන්ත්‍රෝපකරණ	66,377.43
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	57,917.12
ශීතකරණ	37,854.62
පරිඝනක	920,668.18
ලීබඩු හා උපකරණ	84,772.72
කාර්යාලීය උපකරණ	24,264.31
මෘදුකාංග (ක්‍රමක් ක්ෂය)	560,991.60
	3,041,095.98

සටහන 13

පනතේ අරමුණු වෙනුවෙන් වූ වියදම්

දැනුවත් කිරීමේ වැඩසටහන්	560,636.71
අධ්‍යාපන ආධාර වැඩසටහන	9,330,701.57
සනීපාරක්ෂක වැඩසටහන	2,774,705.00
නීති ආධාර වැඩසටහන	948,761.84
නීති සහන අභියාචනා	100,000.00
නීති සහන ශිෂ්‍යත්ව	147,197.04
ශිෂ්‍යත්ව වැඩසටහන	4,081,883.75
තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන	7,345.00
වෛද්‍ය සහන වැඩසටහන	280,000.00
	18,231,230.91

සටහන 14

වෙනත් වියදම්

ප්‍රචාරණ හා ප්‍රවර්ධන	202,610.20
ඵලදායිතා වැඩසටහන	49,785.52
	252,395.72

සටහන 15

පෙර වර්ෂයේ ගැලපීම්

15.1 ස්ථාවර තැන්පතු පොළී	(848,264.48)
15.2 වත්කම් විකිණීමේ ඵලාභය	(2,713.02)
	(850,977.50)

15.1

ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි වෙළඳපල තුල ඉහල පොළී අනුපාතයන් තුල ආයෝජනයන් සිදුකරනු ලබන අතර, දැනට අඩු පොළී අනුපාත යටතේ ආයෝජනය කර ඇති ආයෝජන ඉවත් කර ඉහළ පොළී අනුපාත යටතේ නැවත ආයෝජන කර ඇත, ඒ අනුව එසේ වසා දමන ලද ආයෝජන වලට අපේක්ෂිත පොලිය මෙහි දැක්වේ.

15.2 වත්කම් විකිණීමේ ඵලාභය වාර්තාකර ඇත.

සටහන 16

ශ්‍රම වාසනා අරමුදලේ සභාපති නමින් මහජන බැංකුව නාරාහේන්පිට ශාඛාවේ ගිණුම් 2 පවත්වාගෙන යයි

1 ජංගම ගිණුම් අංක 119100103693128 ශ්‍රම වසනා අරමුදලේ එදිනෙදා ගනුදෙනු සඳහා.

2 ජංගම ගිණුම් අංක 119100293693128 රු.10,000/= වටිනා ඉලෙක්ට්‍රොනික කාඩ් පතක්

සටහන 17

ඉවත් කල සේවකයකු විසින් උපරිමධිකරණයේ අංක SC/HC/LA/86/2022 නමින් නඩුවක් ගොනු කර ඇත

සටහන 18

රඳවා ගැනීමේ බදු

දැනට පවතින බදු ප්‍රතිපත්ති යටතේ ස්ථාවර තැන්පතු පොළී මත රඳවා ගැනීමේ බදු අය කරයි.

සටහන 19

භාණ්ඩාගාරයේ ඇති මුදල්

විවිධ හේතු මත මහා භාණ්ඩාගාරයේ අප නමින් ඇති මුදල් නිදහස් කිරීම සීමා කර ඇත. අප සතුව ඇති මිලියන 20 ක් පමණ ස්ථාවර තැන්පතු වස දැමුවත් ආයතනයේ පරිපාලන වියදම් හා අරමුණු වලට අදාල වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ.

2022 වසරේ ලොතරැයි ආදායම රුපියල් මිලියන 37.5 ක් උවත් භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 5.4ක් පමණක් නිදහස් කර ඇත. මේ නිසා අරමුදලේ අරමුණු වලට වියදමට සාපේක්ෂව අදායම් අඩුවක් පෙන්වයි.

සටහන 20

රාජ්‍ය ප්‍රධාන

රාජ්‍ය ප්‍රධාන වාර්ෂිකව 10% බැගින් ක්‍රමක්ක්ෂය කරනු ලබයි.

සටහන 21

සංසන්ධනාත්මක තොරතුරු

මෙම වසරේ තොරතුරු තහවුරු කිරීම සඳහා පෙර වසරේ තොරතරු අවශ්‍ය තැන්වල දක්වා ඇත.

සටහන 22

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අරමුදල සමග කිසිම ආකාරයක ගිවිසුම් වලට සම්බන්ධයක් නැත.

සටහන 23

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් ශ්‍රම වාසනා අරමුදලේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමට යටත්ව සිදු කර ඇත.

සිව්වන පරිච්ඡේදය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1.1 වාර්තා කරණ ඒකකය.

ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත හා 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් (සංශෝධන) පනත මගින් සංස්ථාගත කර ඇත.

1.2 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය.

2023 පෙබරවාරි මස 02 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය.

ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය කාලපරිච්ඡේදය 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා මාස 12 ක කාලපරිච්ඡේදය නියෝජනය කරයි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශ වලට සටහන් ඇතුලත් වේ. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS'S) අනුකූල ව පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

1.4.2 මිනුම් කිරීමේ පදනම

වත්කම් නැවත ඇගයීම සඳහා ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම ගිණුම් වලට බලපාන උද්ධමනකාරී සාධකයන් ගණනය කොට නැත.

1.4.3 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූලතාවය දැක්වීම සඳහා ප්‍රමාණාත්මක ,විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හා සැසඳිය හැකි වන පරිදි මූල්‍ය ප්‍රකාශ තුලින් වාර්තා කර ඇති සියලුම වටිනාකම් පෙර වර්ෂ වලට අනුව හෙලිදරව් කිරීම් කර ඇත.

අවශ්‍ය අවස්ථාවලදී වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීමට සංසන්දනාත්මක සංඛ්‍යා සංශෝධනය කර ඇත.

1.4.4 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ශ්‍රම වාසනා අරමුදලේ ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වටිනාකමෙන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.4.5 ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී සහ ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී විනිශ්චයන් ,තීන්දු තීරණ හා උපකල්පන භාවිතයට ගැනීම අවශ්‍යය වන අතර ඒවායේ ඇති අවිනිශ්චිතභාවය නිසා අනාගත කාලසීමා සඳහා ඉදිරියට ගෙනයනු ලබන ශේෂයන්ගේ සුවිශේෂී ගැලපුම් සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නැගීමට ඉඩ ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියා වලියේදී මූල්‍ය ප්‍රකාශන වල සුවිශේෂි බලපෑමක් කරනු සමත් පහත දැක්වෙන තීරණ නිශ්චය කිරීම් සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කර ඇත.

අ) දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීව කාලය

වත්කමේ ඵලදායී ජීව කාලය , ක්ෂය කිරීමේ ක්‍රම වේදය හොදම ඇස්තමේන්තුව මත පදනම්ව කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අතර එම නිසාම ඒවා අවිනිශ්චිතතාවයෙන් යුක්ත වේ.

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල යම් වෙනස්කම් මූල්‍ය වාර්තා වලට අදාල සටහන් තුල හෙලිදරව් කර ඇත.

ආ) අඛණ්ඩ පැවැත්ම

ශ්‍රම වාසනා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අවිනිශ්චිතතාවයක් ඇති වන සැලකිය යුතු කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනා ගෙන නොමැති නිසා අරමුදලේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනමක් මත වන අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති එම කාලය පුරාම ක්‍රියාත්මක වේ.

1.5 වත්කම් හා වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.5.1 දේපල පිරියත හා උපකරණ (PPE)

අ) හඳුනාගැනීම හා මිනුම්ගත කිරීම

දේපල පිරියත හා උපකරණ ඒවායේ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය සතු වන්නේ දැයි හෝ එහි පිරිවැය දේපල පිරියත හා උපකරණ පිළිබඳ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව විශ්වාසදායී ලෙස මැනිය හැකි දැයි යන්න මත ඒවායේ ධාරණ අගය විනිශ්චය කිරීම හා ක්ෂය කිරීම හා ඒවාට අදාල හානිකරණ අලාභ හඳුනා ගනු ලැබේ.

මූලික අදියරේ දී දේපල පිරියත හා උපකරණ එහි පිරිවැයට තක්සේරු කරනු ලබයි.

ආ) පිරිවැය

දේපල පිරියත හා උපකරණ වල පිරිවැය එහි මිලදී ගැණුම් පිරිවැය සහ එහි අදහස් කරන භාවිතය සහ කාර්යය මට්ටමට සෘජුවම දායක විය හැකි යම් පිරිවැය ඇතුලත් වේ.

දේපල පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කල පසු ලැබෙන පිරිවැයට දක්වනු ලැබේ.

ත්‍යාග වශයෙන් අරමුදලට ලද ලද වත්කම් රාජ්‍ය ප්‍රධාන ගිණුමට බැර කර දේපල පිරියත හා උපකරණ ගිණුමට හර කර ඇත.

ඇ). පසුකාලීන වියදම්

වත්කම් වල ඉපැයීමේ ධාරිතාව පවත්වා ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම,ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීමේ අරමුණ සඳහා දැරූ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

ඇ). ක්ෂය වීම්

ඉඩම් හැර සෙසු වත්කම් ක්ෂය කිරීමේදී දේපල පිරියත හා උපකරණ අයිතම වල එක් එක් කොටස්වල ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.වත්කම් භාවිතයට ගන්නා අවස්ථාවේ සිට එය ඉවත් කරන දිනය දක්වාම ක්ෂය කිරීම සිදු කරනු ලැබේ.

පහත ක්ෂය අනුපාත යටතේ ක්ෂය කරන ලදී.

වාහන	10%
යන්ත්‍රෝපකරණ	20%
වායුසමීකරණ	20%
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	25%
පරිඝණක	25%
ලී බඩු සහ සවිකිරීම්	10%
කාර්යාල උපකරණ	7.5%
මෘදු කාංග	20%

ඉ). අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් යනු මූල්‍ය වටිනාකමක් සහිත භෞතික නොවන වත්කම් වේ.

ඊ). හඳුනාගැනීමේ පදනම

වත්කමක පිරිවැයට වඩා විශ්වාසවන්තව මැනිය හැකි මෙන්ම එම වත්කම අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුලට ගලා එන්නා වූ භෞතික පැවැත්මක් නොමැති වත්කම් මේ යටතේ හඳුනා ගැනේ.

•. ගිණුම්කරණ මෘදුකාංග

ආයතනය විසින් මිලදී ගන්නා ලද ගිණුම්කරණ මෘදුකාංග අත්පත් කර ගැනීමේ පිරිවැය මත මිනුම් කිරීම සිදු කරන අතර,පිරිවැයෙන් සමුච්චිත ක්‍රම ක්ෂය කපා හැරීම සිදු කරයි.

උ) අස්පෘශ්‍ය වත්කම් ක්ෂය

වත්කම භාවිතයට ගත් දිනයේ සිට වත්කම් ඵලදායී ජීවිත කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්‍රම ක්ෂය කිරීමෙන් ආදායම් ප්‍රකාශනයට ගැලපීම සිදු කරයි.

ඌ). වත්කම් ප්‍රත්‍යාගණනය.

ප්‍රත්‍යාගණනය රජයේ පිළිගත් ඒ පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලත් පුද්ගලයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් වාහන හැර අනෙකුත් සියලුම දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය (SLAPS 07) සිදු කර ඇත.

අරමුදලට පවරා දුන් KO 7519 කාර් රථය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර ඇත. සියලු නව ප්‍රත්‍යාගණන වටිනාකම් ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත.

එ). ඉවත් කිරීම

දේපල පිරියත හා උපකරණ පවත්නා වටිනාකම ඒවා විකිණීමේදී හෝ එමගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථා වලදී ඉවත් කිරීම සඳහා හඳුනා ගැනේ. ප්‍රාග්ධන අයිතම බැහැර කිරීම ශ්‍රී ගිණුම්කරණ ප්‍රමිත (SLAPS 07)අනුව ගිණුම් ගත කර ඇත.

1.5.2 තොගය

තොගය පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ප්‍රකාශ කෙරේ. තොගය බර තැබූ සාමාන්‍ය පිරිවැය මත නිකුත් කිරීම සිදු කර ඇත.

1.5.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් එක්රැස් කරගත නොහැකි සියලුම වටිනාකම් සඳහා වන සියලුම බිල්පත් වල වටිනාකම වේ. ලැබිය යුතුගිණුම් ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සහ ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොළිය වේ.

අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදලට ලැබිය යුතු ප්‍රධාන ආදායම් ප්‍රභවය ජාතික සම්පත ලොතරැයි අලෙවිය මගින් ලැබෙන අලෙවි ආදායමෙන් 10% දායකත්ව දැක්විය හැක. සෑම මසකම එසේ ලැබෙන ලොතරැයි ආදායම ලොතරැයි මණ්ඩලය මගින් ඒකාබද්ධ අරමුදලට බැර කෙරෙන අතර අරමුදලේ වාර්ෂික අවශ්‍යතාවට අනුව කාර්තු වශයෙන් මුදල් නිකුත් කෙරේ. ඒකාබද්ධ අරමුදල තුල ශ්‍රම වාසනා අරමුදල නමින් අරමුදලට ලැබිය යුතුව ඇති මුදල මෙමගින් නිරූපනය වේ.

ආ) ස්ථාවර තැන්පතු ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදල නමින් රාජ්‍ය බැංකු හතරක පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු මගින් වර්ෂයට අදාලව ලැබිය යුතු තිබුව තිබු නමුත් මෙතෙක් නොලැබූ මුදල් වේ.

15.4 ආයෝජන

ආයෝජන වසරකට වඩා අඩු කාලයක් සඳහා වූ කෙටිකාලීන ආයෝජන සහ වසරකට වඩා වැඩි කාලයක් සඳහා වූ දිගුකාලීන ආයෝජන වලින් යුක්ත වේ. මාස තුන මාස හය සහ අවුරුද්දක කාලයක් සඳහා ස්ථාවර තැන්පතු වල සිදු කරන ලද කෙටිකාලීන ආයෝජනයන්ද ශ්‍රම වාසනා අරමුදලේ වෙබ් අඩවිය සහ පරිඝණක ගත තොරතුරු පද්ධතිය සහ ප්‍රමිත සහතිකය ලබා ගැනීම තෙක් සිදු කරන ලද දිගුකාලීන ආයෝජනයන් ද නිරූපනය වේ.

1.5.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

1.6 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂ පත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කල නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කොට ඇත. මූල්‍ය තත්ව ප්‍රකාශයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ.මූල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

1.6.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් හා ප්‍රතිපාදන

අ) පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

1983 අංක 12 හි පාරිතෝෂික පනත ට අනුව ශ්‍රම වාසනා අරමුදල පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී.ඒ සඳහා ගණනය කරන ලද වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනය තුල නිරූපනය කෙරේ.

ආ) දායක සැලසුම් අර්ථ දැක්වීම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ.

සේවකයාගේ මුලු වේතනයෙන් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා 3% ක් අරමුදල විසින් දායක කරනු ලැබේ.

ඇ) නීති ආඥාර ලබා දීම් සඳහා වෙන් කිරීම

ශ්‍රම වාසනා අරමුදලේ එක් අරමුණක් වන නීති ආඥාර ලබා දීමේදී නඩුව විභාග වන අතර තුර පළමු නීති ආඥාර වාරික මුදල් ලබා දෙන අතර දෙවන වාරික මුදල් නඩු වේ නියෝගය ලැබුණු පසු ලබා දීම සිදුවේ. වර්ෂය තුලදී අවසන් නියෝගය නොලද නඩු සඳහා මෙම වෙන් කිරීම් සිදු කර ඇත.

1.7.1 ආදායම/අයභාරය

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ලැබීම් ස්වභාවයේ හෝ ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වැඩි වීමේ ප්‍රතිඵලයක් සේ ලැබෙන ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන්හි දළ ගලා යාමකි. ආදායම හා පොළී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන අතර ආදායමෙහි ඡාතික සම්පත ලොතරැයි ආදායම,ස්ථාවර තැන්පතු පොළී ආදායම ප්‍රධාන වේ.

1.7.2 වියදම

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ගලායෑම් ස්වාභාවයෙන් හෝ වත්කම් පරිභෝජන ස්වාභාවයෙන් හෝ බැරකම් ඇතිවීමේ ස්වාභාවයෙන් සිදුවන ආර්ථික ප්‍රතිලාභයන්ගේ හෝ සේවා ශක්‍යතාවයන්ගේ අඩු වීමකි. ශ්‍රම වාසනා අරමුදලේ කටයුතු පවත්වා ගෙන යාම ,අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමෙහිලා සිදු කරන ප්‍රාග්ධන සහ අයභාර ස්වභාවයේ සියලුම දෑ වේ.

1.8. ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන වැදගත් ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සහ අනාවරණයන් සිදු කිරීමට කටයුතු කර ඇත.

1.9. මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අනුකූලව "වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහය සකස් කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/SVF/SR/01/2022 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 26 දින

සභාපති

ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,
විගණකාධිපති

පිටපත : 1. ලේකම්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය.
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/SVF/SR/01/2022 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි26 දින

සභාපති
ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රම වාසනා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1971 අංක 38 දරන මුදල් පනත සහ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතේ 12(4) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 අරමුදලේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අරමුදලේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට අරමුදලේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අරමුදලේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් කරුණු හැර අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්ථව්‍ය සහ කාර්යයන්	නිරීක්ෂණ
(අ) 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත	
(i) 3 . 3 උප වගන්තිය හා 3 . 4 . (2උ) උප වගන්තිය ප්‍රකාරව රීති සෑදීම	පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය විධිමත් කර ගැනීම සම්බන්ධව රීති සෑදීමට බලය ලබා දී තිබුණත් 2022 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති පිළියෙල කර නොතිබුණි. කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බෙරුම්කරුවෙකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ ඇති නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත්, අදාල රීති 2022 දෙසැම්බර් 31 දිනටත් පිළියෙල කර නොතිබුණි.

(ii)	13 . 1 උප වගන්තිය හා 13 . (2අ) උප වගන්තිය ප්‍රකාරව ලොතරැයි පැවැත්වීම.	අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක් හා යම් ලොතරැයි වර්ග අරමුදල වෙනුවෙන් එක් එක් වර්ෂයේදී පවත්වනු ලැබිය යුතු වුවද, අරමුදල විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකඟතාවයකට එළඹ නොතිබුණි. අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ඇති කර ගන්නා එකඟවීමට වෙනත් කරුණු අතර, • එසේ පවත්වන ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව, • ඒ ලොතරැයිවලදී නිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය පිළිබඳව, සහ • ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව විධිවිධාන ඇතුලත් විය යුතු වුවත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකඟතාවයන්ට එළඹ නොතිබුණි.
(iii)	14 .1 උප වගන්තිය ප්‍රකාරව රීති සැකසීම	මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්ය යැයි මණ්ඩලය සලකන රීති හෝ මේ පනත මගින් රීති සෑදීමේදී බලය දී ඇති හෝ රීති සැදීම අවශ්‍ය යැයි සලකන කාරණා සඳහා රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි වුවද 2022 දෙසැම්බර් 31 දින වන විටත් එබඳු රීති පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.
(iv)	6 (ආ) වගන්තිය ප්‍රකාර මුල්‍ය හා වෙනත් ආධාර සැපයීම	සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුණු අවස්ථාවක, ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම කලයුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට එබඳු මූල්‍ය හා වෙනත් අධාර සපයා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2.3 වෙනත් කරුණු

යැපෙන්නන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.37,565,720 කින් රු.5,400,000 ක් පමණක් ලැබී තිබුණු අතර 2004 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඒකාබද්ධ අරමුදලින් සුභසාධන කටයුතු සඳහා ලැබිය යුතු මුදල රු.378,809,164 ක් විය. ඒ අනුව භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි මුදල් ලබාගත නොහැකි බැවින් සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය වෙනුවෙන් පනතේ දක්වා ඇති අරමුණු ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ඇමුණුම.

දැනුවත් කිරීමේ වැඩසටහන්.

- 2022.01.26 "සතුට ගෘහ" ආයතනයේ සේවක සේවිකාවන් 20ක් හා MAGA Constructions ආයතනයේ සේවක සේවිකාවන් 20ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පැවැත්විම.කම්කරු කාර්යාලය - කුරුණෑගල මුළු වියදම රු.16,597.00
- 2022.01.27 නව මැදගම water Board , Vidul Lanka Plantation , ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 50ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම.නව මැදගම water Board , Vidul Lanka Plantation , ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - දෙහිඅත්තකණ්ඩිය මුළු වියදම රු. 57,526.30
- 2022.02.08 පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල ඇති කර්මාන්තශාලා කීපයක සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 75ක් පමණ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - පොළොන්නරුව මුළු වියදම රු. 57,745.50
- 2022.02.08 රාජ්‍ය නිර්මාණ හා නීතිගත සංස්ථාව - රත්මලාන සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 150ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම.රාජ්‍ය නිර්මාණ හා නීතිගත සංස්ථාව - රත්මලාන මුළු වියදම රු. 27,102.75
- 2022.02.22 රත්නපුර දිස්ත්‍රික්කය තුල ඇති කර්මාන්තශාලා කීපයක සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 80ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - රත්නපුර මුළු වියදම රු. 39,472.15
- 2022.03.04ශ්‍රම වාසනා අරමුදලේ සේවක සේවිකාවන්ගේ ආකල්ප සංවර්ධනය තුලින් වඩා පොහොසත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම.Aqua Pearl Lake Resort - මොරටුව මුළු වියදම රු. 36,650.00
- 2022.03.31 CBL Natural Foods pvt ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 20ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම. CBL Natural Foods pvt ltd - මීගමුවමුළු වියදම රු. 18,035.00
- 2022.04.05 කුරුණෑගල දිස්ත්‍රික්කය තුල ඇති කර්මාන්තශාලා කීපයක සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 60ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම. කම්කරු කාර්යාලය - කුරුණෑගල මුළු වියදම රු. 24,485.84
- 2022.04.08 ICT Contruction හි සේවය කරන සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 63 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම ICT Contruction - කොළඹ මුළු වියදම රු. 9,400.00 (වැඩසටහන් 02ක් සඳහා)
- 2022.04.20 Sapoori Palangi Lanka Lanka ltd work site හි සේවය කරන සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 41 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම Sapoori Palangi Lanka Lanka ltd work site - බම්බලපිටිය
- 2022.07.28NEFAD – Foundation ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 28 දෙනෙකු හා Thaprobane Sea Food Manufacturing ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 21 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම NEFAD Foundation – යාපනය Thaprobane Sea Food Manufacturing - යාපනය මුළු වියදම රු. 62,093.00
- 2022.08.30කුණ්ඩසාලේ Auto Service ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 24 දෙනෙකු පමණ හා Auto Service BOI - පල්ලෙකැලේ ආයතනයේ සේවක සේවිනාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 35 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම කුණ්ඩසාලේ Auto Service Auto Service BOI - පල්ලෙකැලේ මුළු වියදම රු. 31,325.00

- 2022.08.30 Rasuki Appearal (pvt) ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 24 දෙනෙකු Star Fashion Clothing (pvt) ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 22 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමRasuki Appearal (pvt) ltd - ගාල්ල Star Fashion Clothing (pvt) ltd-
- 2022.09.02සිසිලියන් තේ කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 23 දෙනෙකු හා ෆෝල්කන් තේ කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 32 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමසිසිලියන් තේ කර්මාන්තශාලාව - කලවාන ෆෝල්කන් තේ කර්මාන්තශාලාව - ඇලපාත
- 2022.09.13 වතුපිටිවල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ කර්මාන්තශාලා කීපයක සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 37 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම වතුපිටිවල ආයෝජන ප්‍රවර්ධන කලාපය
- 2022.09.16 කෑගල්ල බෝගල ග්‍රෑෆයිට් ලංකා පුද්ගලික සමාගම හා අවට ඇති තර්මාන්තශාලා කීපයක සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය ඇතුළු 71 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමකෑගල්ල බෝගල ග්‍රෑෆයිට් ලංකා පුද්ගලික සමාගම
- 2022.09.30 Maga Construction Site - මිහින්තලේ,Rich Light Export Pvt ltd - අනුරාධපුර, Risalka Fashion – ගලෙන්බිඳුනුවැව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම
- 2022.10.04 බදුල්ල දිස්ත්‍රික්කයේ බොරලන්ද දැව සංස්ථාවේ සේවක සේවිකාවන් ,බටවත්ත තේ කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම
- 2022.10.14 කොග්ගල අපනයන සැකසුම් කලාපයේ වෝග් ටෙක්ස් ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම

සුභසාධක වැඩසටහන්.

- 2022.08.31 අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 103 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී. වැලිඔය මහවැලි පුහුණු මධ්‍යස්ථානය
- 2022.09.30 අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 289 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී. මිණිපේ දේවානන්ද විද්‍යාලය
- 2022.09.30 අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 97 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී. දේවමිත්ත විද්‍යාලය, මීමින්නාවල
- 2022.10.15/16 අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 600 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී. සමනල ක්‍රීඩාංගනය, ගාල්ල
- 2022.11.09 මොරටුව විල්ලෝරාවත්ත ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 215 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී.ඥානිස්සර බෞද්ධ විද්‍යාලය -
- 2022.12.05 අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 16 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී.
- 2022.12.06 අම්පාර ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 200 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබා දෙන ලදී. කම්කරු කාර්යාලය - කල්මුනේ
- 2022.12.22 රඹුක්කන දැලිවල මහා විද්‍යාලය ප්‍රතිලාභීන් 176
- 2022.12.28 පිළියන්දල හා, ජාවත්ත විද්‍යාතිලක විද්‍යාලය හා ගාල්ල කම්කරු කාර්යාලය ලබන දූ දරුවන් 185



ශ්‍රම වාසනා අරමුදල ,අංක ,97 ජාවත්ත පාර ,කොළඹ 05